**විශේෂ සටහන 18** **ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග : 2011[1]**

## මූර්ත අංශය

| | | |
|---|---|---|
| 2011 ජනවාරි 01 | - | විදුලි ඒකකයක සාමාන්‍ය ගාස්තුව සියයට 8 කින් වැඩිකරන ලදී. |
| 2011 මාර්තු 01 | - | නැවුම් කිරි සඳහා ගොවිපොළ මිල ලීටරයකට රුපියල් 35 සිට රුපියල් 50 දක්වා වැඩි කරන ලදී. |
| 2011 අප්‍රේල් 02 | - | ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල පහත පරිදි වැඩිකරන ලදී: |
| | | - පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 125 දක්වා, රුපියල් 10 කින් |
| | | - ඩීසල් ලීටරයක මිල රුපියල් 76 දක්වා, රුපියල් 3 කින් |
| | | - භූමිතෙල් ලීටරයක මිල රුපියල් 61 දක්වා, රුපියල් 10 කින් |
| | - | කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,890 දක්වා රුපියල් 238 කින් වැඩි කරන ලදී. |
| 2011 මැයි 03 | - | ග්‍රෑම් 400 සම්පූර්ණ යොදය සහිත කිරිපිටි පැකට්ටුවක උපරිම සිල්ලර මිල රුපියල් 264 දක්වා රුපියල් 20 කින් ද කිලෝග්‍රෑම් 1 ක සම්පූර්ණ යොදය සහිත කිරිපිටි පැකැට්ටුවක මිල රුපියල් 647 දක්වා රුපියල් 49 කින් ද වැඩි කරන ලදී. |
| 2011 ජූනි 30 | - | 2006/2007 හි දී පැවැත්වුණු කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය පදනම් කොට ගෙන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (2006/2007=100) සංශෝධනය කරන ලදී. |
| | - | කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (2006/2007=100) භාණ්ඩ හා සේවා පැසෙහි අඩංගු නැවුම් ආහාර, බලශක්තිය, ප්‍රවාහනය, සහල් සහ පොල්, ඉවත් කර මූලික උද්ධමන මැනීමේ සංශෝධිත දර්ශකයක් හඳුන්වා දෙන ලදී. |
| 2011 අගෝස්තු 20 | - | කිලෝග්‍රෑම් 12.5 ක ගෘහස්ථ එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 2,046 දක්වා රුපියල් 156 කින් වැඩිකරන ලදී. |
| 2011 ඔක්තෝබර් 30 | - | ඛනිජ තෙල් නිෂ්පාදන වල සිල්ලර මිල පහත පරිදි වැඩිකරන ලදී. |
| | | - පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 137 දක්වා රුපියල් 12 කින් |
| | | - ඩීසල් ලීටරයක මිල රුපියල් 84 දක්වා රුපියල් 8 කින් |
| | | - භූමිතෙල් ලීටරයක මිල රුපියල් 71 දක්වා රුපියල් 10 කින් |
| 2012 පෙබරවාරි 12 | - | ඛනිජ තෙල් නිෂ්පාදන වල සිල්ලර මිල පහත පරිදි වැඩිකරන ලදී. |
| | | - පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 149 දක්වා රුපියල් 12 කින් |
| | | - ඩීසල් ලීටරයක මිල රුපියල් 115 දක්වා රුපියල් 31 කින් |
| | | - භූමිතෙල් ලීටරයක මිල රුපියල් 106 දක්වා රුපියල් 35 කින් |
| 2012 පෙබරවාරි 14 | - | මගී ප්‍රවාහන බස් ගාස්තු සියයට 20 ක සාමාන්‍ය ප්‍රතිශතයකින් වැඩි කරන ලදී. |
| 2012 පෙබරවාරි 16 | - | මාසික විදුලි බිල්පතට පහත පරිදි ඉන්ධන ගැලපුම් ගාස්තුවක් හඳුන්වා දෙන ලදී. |

[1] 2011 වසර තුළදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මෙයට ඇතුළත් වේ. 2012 වසරේ පළමු මාස තුන තුළදී ක්‍රියාත්මක කරන ලද සහ 2012 වසර තුළදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය වෙනස්කම් හා ක්‍රියාමාර්ග ද මීට ඇතුළත් වේ.

| අංශය | | ඉන්ධන ගැලපුම් ගාස්තුව (ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|
| ගෘහස්ත පාරිභෝගිකයන් | | |
| මාසිකව - ඒකක | 0 - 30 | 25 |
| මාසිකව - ඒකක | 31 - 60 | 35 |
| මාසිකව - ඒකක | 60 ට ඉහළ | 40 |
| කර්මාන්ත | | 15 |
| හෝටල් | | 15 |
| පොදු කාර්යයන් | | 25 |

## විදේශ අංශය

### වෙළෙඳ සහ තීරු බදු

2011 ජනවාරි 01 - මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ රජයේ අමාත්‍යාංශවලට සෘජුවම ලැබෙන පරිත්‍යාග හෝ විදේශ ණය මත ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන්වලට ආනයන කරන භාණ්ඩ, ජාතිය ගොඩනැගීමේ බද්දෙන් (NBT) සහ එකතුකළ අගය මත බද්දෙන් (VAT) නිදහස් කරන ලදී.

- මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ආයුර්වේද නිෂ්පාදන සඳහා විශේෂයෙන්ම යොදාගනු ලබන ආනයන සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ආයුර්වේද නිෂ්පාදන (විලේපන සැකසීම් හැර) ඇසිරීම සඳහාම විශේෂයෙන් භාවිතා කරන ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

- සං.ව.සංකේත 2713.20 සහ සං.ව.ශීර්ෂ 27.14 යටතේ ආනයනය කරන ලද බිටුමන් අඩංගු සංයෝග සහ සං.ව.සංකේත 8701.10.10, 8701.10.90, 8701.90.10 සහ 8701.90.20 යටතේ ආනයනය කරන ට්‍රැක්ටර් වර්ග ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

- සම් කර්මාන්තය හෝ පාවහන් කර්මාන්තය සඳහා භාවිතාවන යන්ත්‍ර හා උපකරණ, අධි තාක්ෂණික වෛද්‍ය, විද්‍යාගාර සහ අධ්‍යාපනික උපකරණ, කුලීරථ මීටර, කෘෂිකාර්මික යන්ත්‍ර හා කොටස්, විද්‍යුත් උපකරණ, විලාසිතා ආභරණ නිෂ්පාදන සඳහා භාවිතා කරන භාණ්ඩ, විදුලි සංදේශ කර්මාන්තය සඳහා භාවිතා වන යන්ත්‍ර හා අධි තාක්ෂණික උපකරණ සහ ගුවන් යානා ආකෘති හා කොටස් ආනයනය එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

2010 ජනවාරි 11 - පෙට්‍රල් ආනයනය කිරීම සඳහා ලබාදුන් තීරු බදු අත්හැරීම ලීටරයකට රුපියල් 20 සිට ලීටරකට රුපියල් 30 දක්වා වැඩිකරන ලදී. ඒ අනුව පෙට්‍රල් ලීටරයකට බලපවත්නා තීරු බදු අනුපාතිකය රුපියල් 5 ක් වේ.

2010 ජනවාරි 22 - කිරි පිටි ආනයනය සඳහා සම්පූර්ණ තීරු බදු අත්හැරීමක් ප්‍රදානය කරන ලදී.

2010 පෙබරවාරි 20 - අර්තාපල් ආනයනය සඳහා අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද (SCL) ඉදිරි මාස තුනක් සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා වැඩිකරන ලදී.

2011 අප්‍රේල් 01 - පෙට්‍රල් ආනයනය සඳහා සම්පූර්ණ තීරු බදු අතහැරීමක් ලබාදෙන ලදී.

2011 අප්‍රේල් 10 - වියළි හාල් මැස්සන්, රතු ළූණු, ලොකු ළූණු, සුදු ළූණු, මැ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, මුං ඇට, මයිසූර් පරිප්පු, වියළි මිරිස්, ටින් මාළු සහ සීනි ආනයන කිරීමේ දී අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද තවත් මාස 4 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.

2011 අප්‍රේල් 24 - ආනයනයට සුදුසු මෝටර් රථවල යෝග්‍ය කාලසීමාව අවුරුදු 3 1/2 සිට අවුරුදු 2 දක්වා අඩු කරන ලදී.

2011 මැයි 03 - අර්තාපල් ආනයන සඳහා අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස 4 ක් සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩිකරන ලදී.

| | | |
|---|---|---|
| 2011 අගෝස්තු 10 | - | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක් සඳහා ආර්තාපල් ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 35 දක්වා ද ලොකු ළූණු සහ සුදු ළූණු ආනයන සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා වැඩි කරන ලදී. |
| | - | වියළි හාල්මැස්සන්, රතු ළූණු, මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, පරිප්පු, මුං ඇට, වියළි මිරිස්, ටින් මාළු සහ සීනි ආනයනය කිරීමේ දී අය කළ වෙළෙඳ භාණ්ඩ තවත් මාස 4 ක් කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2011 අගෝස්තු 30 | - | සං.ව.සංකේත 0801.31.10 සහ 0801.31.90 යටතේ ආනයනය කරන පොත්ත සහිත කජු මද සඳහා සියයට 30 ක සම්පූර්ණ තීරු බදු අතහැරීමක් ලබා දෙන ලදී. |
| 2011 ඔක්තෝබර් 14 | - | මුං ඇට සහ කුඩු කළ හෝ ඇඹරූ මිරිස් ආනයනය කිරීමේ දී අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පිළිවෙළින් කිලෝග්‍රෑමයකට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා සහ කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා වැඩිකරන ලදී. |
| | - | උඳු, කව්පි සහ කුරක්කන් හා අනෙකුත් මිලට් වර්ග ආනයනය මත පිළිවෙලින් කිලෝග්‍රෑමයකට රුපියල් 90, කිලෝග්‍රෑමයකට රුපියල් 75 සහ කිලෝග්‍රෑමයකට රුපියල් 30 ලෙස විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද හඳුන්වා දෙන ලදී. |
| 2011 නොවැම්බර් 22 | - | මුං ඇට, උඳු හා කව්පි ආනයනය කිරීමේ දී අයකළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පිළිවෙළින් කිලෝග්‍රෑමයකට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 50 දක්වාත්, කිලෝග්‍රෑමයකට රුපියල් 90 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 100 දක්වාත්, කිලෝග්‍රෑමයකට රුපියල් 75 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 100 දක්වාත් වැඩිකරන ලදී. |
| | - | කුරක්කන් සහ අනෙකුත් මිලට් වර්ග ආනයනය සඳහා වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 30 සිට රුපියල් 75 දක්වා වැඩි කරන ලදී. |
| | - | උම්බලකඩ, කරවල, තෝරාගත් පළතුරු, තෝරාගත් කුළුබඩු, කුරක්කන් පිටි, උඳු පිටි සහ රට කජු (පොත්ත සහිත) ආනයනය කිරීමේ දී විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස 4 ක කාලයක් සඳහා හඳුන්වා දෙන ලදී. |
| | - | කුඩා පරිමාණ ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සඳහා වන පයිප්ප, බියුටයිල් රබර්, රබර් කෙඳි, වාත්තු යකඩවල ඉවත ලන ද්‍රව්‍ය, ගාංචු, පහසුවෙන් විවෘත කළ හැකි ලෝහ මූඩි, හැඳි ගෑරුප්පු, රේසර් සහ සෙල්ලම් බඩු ආනයනය සෙස් බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | පිඡ්ඡ, ප්‍රාථමික ස්වරූප දරණ එතිලින්හි බහු අවයවික, ප්ලාස්ටික් සනීපාරක්ෂක භාණ්ඩ, වානේ සින්ක්, නාන බේසම්, රූපලාවන්‍ය නිෂ්පාදන, ක්‍රීඩා භාණ්ඩ බෑග්, ඇඟළුම්, පාවහන්, හිස් ආවරණ, විසිතුරු පෝසිලේන් නිෂ්පාදන, පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන, ගමන් මලු, අත් බෑග්, බඳ පටි, කමිස, කොට කලිසම්, ක්‍රීඩා ඇඳුම්, පිහිනුම් ඇඳුම් හා ක්‍රීඩා සපත්තු අයිතමයන් ආනයනය මත වූ සෙස් බද්ද අඩු කරන ලදී. |
| | - | ඇතැම් කාණ්ඩවලට අයත් වියළි එළවළු/වියළි පළතුරු, හඳුන්කූරු හා වයිනයිල් ක්ලෝරයිඩ් ආනයනය සඳහා වූ සෙස් බද්ද ඉහළ දමන ලදී. |
| | - | තිරිඟු පිටි, ත්‍රිපෝෂ, ශීතකරණ, බයිසිකල් රිම්, ගෝස් සහ වෙළුම් පටි ආනයනය මත සෙස් බද්ද හඳුන්වා දෙන ලදී. |
| | - | අපනයනය කරන අමු රබර්වල සෙස් බද්ද ඉහළ දමන ලදී. |
| | - | අපනයනය කරන ස්වභාවික මිනිරන්, මැටි, වැලි, පොස්පේට්, ගල්, ග්‍රැනයිට්, වැලි ගල්, මයිකා, ඉල්මනයිට්, රූටයිල්, ටයිටේනියම්, සර්කෝනියම් හා සකස් නොකළ ඇව කඳන් සඳහා සෙස් බද්ද හඳුන්වා දෙන ලදී. |
| | - | බෙල් යතුරුලියන, බෙල් යතුරුලියනවල කොටස්, සැකසූ මැලියම් හා වෙනත් ඇලවුම් ද්‍රව්‍ය, සංතෘප්ත පොලියෙස්ටර්, වල්කනයිස් නොකළ සංයුක්ත රබර්, ජෙලටින් කරල්, ඇස් කණ්නාඩි සඳහා අමුද්‍රව්‍ය, පහසුවෙන් විවෘත කළහැකි මූඩි, ක්‍රීඩා පාවහන්, ඩීසල් එන්ජිම් (අලුත්), භාණ්ඩ ප්‍රවාහනය කරන රථ, ලාම්පු සහ ආලෝකකරණයට අදාළ තෝරාගත් අයිතම කිහිපයක්, ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර, විසිතුරු පෝසිලේන් හා පිඟන් මැටි නිෂ්පාදන, හැඳි ගෑරප්පු, අව්කණ්නාඩි හා කොණ්ඩ සැකසුම් උපකරණ ආදිය ආනයනය තීරු බද්දෙන් නිදහස් කරන ලදී. |

| | | |
|---|---|---|
| | - | වයිනයිල් ඇසිටේට් බහු අවයවකය, වල්කනයිස් කරන ලද රබර් නූල් රබර් සඳහා අච්චු සහ ප්ලාස්ටික් ආනයනය සඳහා තීරු බද්ද සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී. |
| | - | වානේ හා සකසන ලද ආකෘති, රේසර් තල, වීදුරු භාණ්ඩ, පෙර සවි ගොඩනැගිලි ආනයනය සඳහා තීරු බද්ද සියයට 30 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී. |
| | - | ශීතකරණ ආනයනය සඳහා වූ තීරු බද්ද සියයට 30 සිට සියයට 15 දක්වා අඩු කරන ලදී. |
| | - | බස් හෝ ලොරි සඳහා රබර්වලින් සෑදූ ටයර් ආනයනය සඳහා වූ තීරු බද්ද සියයට 30 සිට සියයට 15 දක්වා අඩු කරන ලදී. |
| | - | තිරිඟු, සෝයා බෝංචි හා මුං ඇට යොදා සකස් කළ ආහාර ආනයනය සඳහා තීරු බද්දක් හඳුන්වා දෙන ලදී. |
| | - | වාතරෝධක රබර් ටයර් සඳහා තීරු බද්ද වැඩි කරන ලදී. |
| | - | සන්නමක් සහිත ඇතැම් කාණ්ඩවල පාවහන් ආනයනය සඳහා තීරු බද්ද යුගලයක් සඳහා රුපියල් 100 කට සීමා කරන ලදී. |
| | - | විදුලියෙන් ක්‍රියාත්මක වන යතුරු පැදි (සං.ව.සංකේත 8711.90.10) සහ ප්‍රාථමික අවස්ථාවේ වන එතිලීන් බහු අවයවික (සං.ව.ශීර්ෂ 39.01) ආදිය නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) වලින් නිදහස් කරන ලදී. |
| 2011 දෙසැම්බර් 10 | - | අර්තාපල් ආනයනයේ දී විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස 4 ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 35 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා අඩු කරන ලදී. |
| 2012 ජනවාරි 01 | - | පහත සඳහන් ආනයන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.<br>- ශබ්ද විකාශන යන්ත්‍ර හා ඇම්ලිෆයර්ස්, ශ්‍රව්‍ය සංඛ්‍යාත විද්‍යුත් වර්ධක හා උපාංග, සිනමා මාධ්‍ය උපකරණ, ඩිජිටල් භාවිතා කරන කියවීමේ උපකරණ ආදිය<br>- හරිතාගාර, පොලි ටනල්ස් සහ හරිතාගාර ඉදිකිරීම සඳහා හා පොලි ටනල්ස් නිෂ්පාදනය සඳහා වගාකරුවනට අවශ්‍ය වන ද්‍රව්‍ය<br>- ලොරි, ට්‍රක් රථ, බස් රථ, ක්‍රීඩා උපකරණ, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍රෝපකරණ, ඉරු දැව, අච්කණ්නාඩි, සුවඳ විලවුන්, උදළු, මුල්ලු, සහ අච්චු (ලෝහ, වීදුරු, රබර්,ප්ලාස්ටික්), කුකුළු කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ හා උපාංග, ආලෝක සංවේදී අර්ධ සන්නායක උපකරණ සහ ඇස් කණ්නාඩි හා ඇස් කණ්නාඩි රාමු නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ආනයනය හෝ සැපයුම් |
| | - | අහස් යානා, නැව්, කෘතිම පාද, කිහිලිකරු, රෝද පුටු, ශ්‍රවන ආධාරක, එම ආධාරක සඳහා වන අමතර කොටස්, දෘශ්‍යාබාධිතයින් සඳහා සුදු සැරයටි, බ්‍රේල් යතුරු ලියන සහ කොටස්, බ්‍රේල් ලියන පත්‍රිකා සහ පුවරු දැව කඳන්, මහන නූල් හා එළවළු කෙඳි ආශ්‍රිත නූල් හැර අනෙකුත් නූල් සහ රෙදිපිළි ආදිය ආනයනය ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2012 ජනවාරි 13 | - | සීනි, පියළි නොකළ මයිසූර් පරිප්පු, පියළි කළ මයිසූර් පරිප්පු සහ සුදු ළූනු ආදි තෝරාගත් අයිතමයන් කිහිපයක් ආනයනය සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හතකර කාලයක් සඳහා වැඩි කරන ලදී. |
| | - | අලුත් හෝ ශීතකල මසුන් සහ හිමායිත මසුන්, සෝයා බෝංචි තෙල් ඇතුළු පාම් තෙල්, සූරියකාන්ත තෙල් සහ පොල් තෙල් ආදී අයිතමයන් ආනයනය සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස 4 ක කාලයක් සඳහා අළුතින් හඳුන්වා දෙන ලදී. |
| | - | පෙට්‍රල් සහ ඩීසල් ආනයනයේ දී ලබා තිබූ සම්පූර්ණ තීරු බද්ද අත්හැරීම පිළිවෙලින් ලීටරයකට රුපියල් 35 සිට ලීටරයකට රුපියල් 23 දක්වා හා ලීටරය රුපියල් 15 සිට රුපියල් 13 දක්වා අඩු කරන ලදී. |
| 2012 මාර්තු 01 | - | අර්තාපල් ආනයනය සඳහා අයකරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩිකරන ලදී. |
| 2012 මාර්තු 31 | - | ආනයනික මෝටර් වාහන අමතර කොටස් සඳහා වන තීරු බද්ද සංශෝධනය කරන ලදී. |

| | | |
|---|---|---|
| | - | සං.ව.ශීර්ෂ 87.03 සහ 87.02 යටතේ ආනයනයට සුදුසු මෝටර් රථවල (බස් රථ හැර) යෝග්‍ය කාල සීමාව අවුරුද්දක් දක්වා ද සං.ව. ශීර්ෂ 87.04 යටතේ ආනයනයට සුදුසු මෝටර් රථවල යෝග්‍ය කාල සීමාව අවුරුදු 3 1/2 ක් දක්වා ද සංශෝධනය කරන ලදී. |

**විදේශ විනිමය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2011 ජනවාරි 01 | - | ශ්‍රී ලාංකීය නේවාසිකයන්ට, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හවුල් ව්‍යාපාර සහ ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගම්වලට විදේශීය සමාගම් හි කොටස් සහ විදේශීය රජයන් මගින් නිකුත් කර ඇති ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවසර ලබාදෙන ලදී. |
| | - | ශ්‍රී ලාංකීය සමාගම් සහ හවුල් ව්‍යාපාරවලට විදේශයන්හි ව්‍යාපාර ස්ථාන ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අදාල ගෙවීම් අනේවාසිකයන්ට ගෙවීම සඳහා අවසර ලබාදෙන ලදී. |
| 2011 ජනවාරි 06 | - | ප්‍රමාණවත් පරිදි විදේශ විනිමය උපයන සේවා අපනයනය කරන්නන්ට ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන සහ ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීම පිණිස දේශීය බැංකු ඒකක මගින් විදේශ විනිමය ණය ලබාදීමට බලයලත් වෙළෙඳුන්ට අවසර ලබාදෙන ලදී. |
| 2011 ජනවාරි 21 | - | නේවාසිකයන්ගේ විදේශ ආයෝජන සඳහා පහසුකම් සැලසීමට “ප්‍රතිමුඛ ආයෝජන ගිණුම” නමින් නව ගිණුමක් හඳුන්වා දෙන ලදී. |
| 2011 මැයි 16 | - | තෝරාගත් බැංකු නොවන ආයතනවලට හා සුපිරි වෙළෙඳසැල්වලට මුදල් හුවමාරු කටයුතු කිරීමට අවසර ලබා දෙන ලදී. |
| 2011 අගෝස්තු 18 | - | අනේවාසිකයන් සහ විදේශීය අරමුදල් ආයෝජකයන්ට ඒකක භාරයන්හි ආයෝජනයන්ට අදාළ විනිමය පාලන සීමා ලිහිල් කරන ලදී. |
| | - | උසස් අධ්‍යාපන කටයුතු සඳහා විදේශ ගතව ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ට, විදේශීය බැංකු, මූල්‍ය ආයතන, විශ්ව විද්‍යාල හෝ විදේශීය අධ්‍යාපන ආයතනවලින් ණය ලබාගැනීමට අවසර ලබාදුන් අතර, එම ණය පියවීම සඳහා බලයලත් විනිමය වෙළඳුන් හරහා ලංකාවෙන් මුදල් ප්‍රේෂණයටත් අවසර ලබාදෙන ලදී. |
| | - | අනේවාසික ශ්‍රී ලාංකිකයන්ට හිමි ශ්‍රී ලංකාවේ පිහිටි දේපොළ මිලදී ගැනීමේ දී ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් කිරීම සඳහා නේවාසික ගැනුම්කරුවන්ට අවසර ලබා දෙන ලදී. |
| | - | අනේවාසික ශ්‍රී ලාංකිකයන්ගේ නමින් “අනේවාසික ආවෘත ගිණුම්” විවෘත කිරීම සඳහාත් එම අනේවාසික ගිණුම්වලට ඔවුන්ගේ දේශීය ආදායම් බැර කිරීම සඳහාත් බලයලත් වෙළෙඳුන්ට අවසර ලබා දෙන ලදී. |
| | - | ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශිකයන්ට “නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RNNFC)” වලට විශ්‍රාමික පාරිභෝගික ප්‍රතිලාභ හැරුණුකොට ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් කරන වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ බැර කිරීම සඳහා අවසර ලබා දෙන ලදී. |
| 2011 නොවැම්බර් 22 | - | පොලී අනුපාතය මත පනවා තිබූ උපරිම සීමාව හා ණයකර නිකුත් කරන ආයතනය විසින් නිදන් අරමුදලක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය ඉවත් කරමින් සහ අවම කල් පිරීමේ කාලය වසර 5 සිට වසර 2 දක්වා අඩු කරමින් ණයකරවල සිදු කරන විදේශ ආයෝජන හා සම්බන්ධ රෙගුලාසි ලිහිල් කරන ලදී. |
| 2011 දෙසැම්බර් 06 | - | භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කරනු ලබන විදේශීය ආයෝජනයන්ට අදාළ වන සීමාව නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල වටිනාකමින් පිළිවෙලින් සියයට 10 සිට සියයට 12.5 දක්වා ඉහළ දමන ලදී. |
| 2011 දෙසැම්බර් 13 | - | දේශීය ආයතනයකට විදේශීය ණය ලබාගැනීමේදී දැනට බලපැවැත්වෙන සීමාව එ.ජ. ඩොලර් මිලියන 20 සිට එ.ජ. ඩොලර් මිලියන 50 දක්වා වැඩි කරන ලදී. |

**අපේක්ෂිත**

| | | |
|---|---|---|
| | - | විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් භාවිතා කරමින් පුද්ගලික පරිහරණය සඳහා භාණ්ඩ ආනයනය කිරීමේ දී දැනට පවත්නා සීමාව ඉහළ දැමීම. |

- දේශීය ලැයිස්තුගත සමාගම් විසින් විදේශ ආයෝජනයන් සිදු කිරීමේ දී අදාළ වන සීමාව ඉහළ දැමීම.
- සියලුම ආයෝජන ගිණුම් ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකාවේ සිදුකරන විදේශ ආයෝජන සඳහා පොදු ගිණුමක් හඳුන්වා දීම.
- දේශීය සමාගම්වලට විදේශීය සුරැකුම්පත් හුවමාරුවල ලියාපදිංචි වීම සඳහා අවසර ලබාදීම.
- ගෙවා නිදහස් කළ හැකි වරණීය කොටස් අනේවාසිකයන් හට නිකුත් කිරීම සඳහා අවසර ලබා දීම.
- බලයලත් වෙළෙඳුන් විසින් නිකුත් කරනු ලබන ඇපකර මත වන වත්මන් සීමාව ඉහළ නැංවීම සඳහා අවසර ලබාදීම.
- ශ්‍රී ලාංකිකයන් විදේශගත වීමේ දී රැගෙන යාමට අවසර ලබාදී ඇති දේශීය මුදල් ප්‍රමාණය ඉහළ දැමීම.
- සංචාරක මණ්ඩලය සමග ලියාපදිංචි වී ඇති හෝටල් සහ අවන්හල් සඳහා මුදල් හුවමාරුකිරීමේ බලපත්‍ර නිකුත් කිරීම.
- බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම්වලට අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට අවසර ලබාදීම.

## රාජ්‍ය මූල්‍ය අංශය

**රාජ්‍ය ආදායම**

2011 ජනවාරි 01

- සියයට 20 ක එකතු කළ අගය මත බදු අනුපාතය, සියයට 12 ක බදු අනුපාතයක් දක්වා අඩුකරන ලදී. ඒ අනුව, ශුන්‍ය අනුපාතය (zero rate) අදාළ භාණ්ඩවලට හැර අනෙකුත් සියලුම භාණ්ඩ සඳහා එකම බදු අනුපාතයක් අදාළ වේ.
- එකතු කිරීමේ අගය මත බද්ද සඳහා බලපාන යෙදවුම් බද්ද හිලව් කිරීමේ සීමාව නිමැවුම් බද්දෙන් සියයට 85 සිට සියයට 100 දක්වා වැඩි කරන ලදී.
- පහත සඳහන් සේවාවන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී:
  - විදුලි සංදේශ සේවා
  - ජීව අපද්‍රව්‍ය භාවිතා කරමින් දේශීය වශයෙන් නිෂ්පාදිත පැලට් සහ බ්‍රිකට්
  - දේශීය වශයෙන් සංවර්ධනය කරන ලද මෘදුකාංග
  - රක්ෂණ ව්‍යාපාරයේ දී කොමිස් හෝ වන්දි මුදල් වශයෙන් යම් දේශීය රක්ෂණ සමාගමකට ප්‍රතිරක්ෂණ සේවා මගින් ලැබුණු ලැබීම්
  - 1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මගින් පිහිටුවන ලද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දේශීය විදුලි සංදේශ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව
- පළාත් සභා මගින් අය කළ පිරිවැටුම් බද්ද ඉවත් කරන ලදී.
- තොග සහ සිල්ලර වෙළෙඳාමෙහි යෙදී සිටින පුද්ගලයන් ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් කරන ලදී.
- ජාතිය ගොඩනැගීමේ බදු අනුපාතය සියයට 3 සිට සියයට 2 දක්වා අඩු කරන ලදී.
- යම් තැනැත්තෙකුගේ භාණ්ඩ හෝ සේවා සැපයුම්වල බද්දට යටත් පිරිවැටුම මාසිකව රුපියල් 500,000 නොඉක්මවන්නේ නම් හෝ පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරතවන පුද්ගලයන්ගේ බද්දට යටත් පිරිවැටුම කාර්තුවකට රුපියල් මිලියන 25 නොක්මවන විට එම පුද්ගලයන් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

- හෝටලයක්, සංචාරක නිවාසයක්, භෝජනාගාරයක් හෝ ඒ හා සමාන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
- දේශීයව සකසාගත් කෘෂි බෝග වෙළෙඳපොළට සකස් කිරීම සම්බන්ධ වූ යම් ක්‍රියාකාරකම්
- දේශීයව ස්ථාපනය කරනු ලැබූ ඕනෑම අධ්‍යාපන ආයතනයක් විසින් අධ්‍යාපන සේවා සැපයීම.
- මිනිස් ශ්‍රම සැපයීම

- ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද ඉවත් කරන ලදී.
- විදුලි සංදේශ සේවා මත ජංගම දුරකථන ග්‍රාහක බද්ද, ජාතිය ගොඩනැඟීමේ බද්ද, එකතු කළ අගය මත බද්ද සහ පරිසර සංරක්ෂන බද්ද වෙනුවට සියයට 20 ක සංයුක්ත විදුලි සංදේශ බද්දක් හඳුන්වා දෙන ලදී.
- විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන් සඳහා වාර්ෂික දළ පිරිවැටුම මත සියයට 2 ක සෙස් බද්දක් හඳුන්වා දෙන ලදී.
- දුම්වැටි මත පනවා තිබූ නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී.

2011 ජනවාරි 07

- මෝල්ට් මත්පැන් හැර සියලුම සැර මත්පැන් සඳහා වූ නිෂ්පාදන බද්ද සම්මත ලීටරයකට රුපියල් 50 කින් වැඩි කරන ලදී.

2011 අප්‍රේල් 01

- පුද්ගල ආදායම් බද්ද ගණනය කිරීමේ දී බදු නිදහස් දීමනාව රුපියල් 300,000 සිට රුපියල් 500,000 දක්වා වැඩි කරන ලදී.
- පුද්ගල ආදායම් බද්ද සඳහා බලපවත්නා ආදායම් ස්ථරයන් පහත පරිදි සංශෝධනය කරන ලදී:

| | | |
|---|---|---|
| පළමු රු. 500,000 (බදු අය වන ආදායමෙන්) | - | සියයට 4 |
| ඊළඟ රු. 500,000 | - | සියයට 8 |
| ඊළඟ රු. 500,000 | - | සියයට 12 |
| ඊළඟ රු. 500,000 | - | සියයට 16 |
| ඊළඟ රු. 1,000,000 | - | සියයට 20 |
| ඉතිරිය | - | සියයට 24 |

- උපයන විට ගෙවීම් බද්ද (PAYE) ගණනය කිරීම සඳහා බදු නිදහස් දීමනාව රුපියල් 500,000 සිට රුපියල් 600,000 දක්වා වැඩි කරන ලදී.
- රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා උපයන විට ගෙවීම් බද්ද හඳුන්වා දෙන ලදී.
- සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම එකම ආදායම් මාර්ගය වන අවස්ථාවන්හි දී ඒ මත (රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ගේ) අයකරගනු ලබන උපයන විට ගෙවීම් බද්ද, අවසාන ආදායම් බද්ද ලෙස සලකන ලදී.
- සමාගම් හෝ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් පැවති සියයට 30, 33 1/3 හෝ 35 සංස්ථාපිත ආදායම් බදු අනුපාත සියයට 28 දක්වා අඩුකරන ලදී.
- අනෙකුත් සංස්ථාපිත ආදායම් බදු අනුපාත පහත පරිදි වේ:
  - බදු අය කළ හැකි ලාභය රුපියල් මිලියන 5 නොඉක්මවන ඉදිකිරීම්, සංචාරක ව්‍යාපාරය, අපනයන ලාභ සහ සුදුසුකම් ලැබූ සමාගම් සඳහා සියයට 15 ක්ව පැවති සහනදායී සංස්ථාපිත ආදායම් බදු අනුපාතය සියයට 12 දක්වා අඩු කරන ලදී.
  - දේශීය එකතු කළ අගය සියයට 65 ක් ඉක්මවන සහ ශ්‍රී ලංකා සන්නම් නාමයක් සහිත පෙටන්ට් හිමිකම ඇති ශ්‍රී ලංකාවේ පවතින යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තෙකු සඳහා බලපාන උපරිම බද්ද සියයට 10 කට සීමා කරන ලදී.

  - සමාජ ශාලා සහ සංගම්, ගබඩා පහසුකම් ලබාදෙන හෝ පවත්වාගෙන යන ආයතන, දේශීය වශයෙන් මෘදුකාංග සංවර්ධනය කරන හෝ ශ්‍රම සැපයුම් කරන යම් ආයතන සහ අධ්‍යාපන සේවාවන්ගෙන් ලබන ලාභ හා ආදායම් සඳහා බලපවත්නා බද්ද සියයට 10 දක්වා අඩු කරන ලදී.
  - අවදානම් ප්‍රාග්ධන සමාගම්, ඛනිජ තෙල් ගවේෂණ සමාගම්, විනෝද කටයුතු සිදුකරන්නන් හෝ කලා ශිල්පීන් සඳහා අයකරන බද්ද සියයට 12 දක්වා අඩු කරන ලදී.
  - හවුල් ව්‍යාපාරයක බෙදිය හැකි ලාභය සහ අනෙකුත් ආදායම් මත වූ බද්ද සියයට 10 සිට 8 දක්වා අඩු කරන ලදී.
  - දේශීය ආදායම් පනතේ 16 වන වගන්තියේ සඳහන් යම් කෘෂිකාර්මික ව්‍යවසායයක ලාභ සහ ආදායම් සඳහා බලපාන උපරිම බදු අනුපාතය සියයට 10 කට සීමා කරන ලදී.
  - මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන හෝ ආනයනය කිරීමේ නිරතවන තැනැත්තන් සඳහා අදාළ බදු අනුපාතය සියයට 40 දක්වා වැඩි කරන ලදී.
  - ධීවර කර්මාන්තය, වගාවන් සහ කෘෂි බීජ නිෂ්පාදනය සහ වගා කිරීමට ගන්නා ද්‍රව්‍ය, යන ක්ෂේත්‍රයන් 2011 අප්‍රේල් 1 දින සිට වසර 5 ක් දක්වා බද්දෙන් නිදහස් කරන ලදී.
  - කළමනාකරණය, මුදල් සැපයීම, සැපයුම් දාම සහ මිල සටහන් කිරීම වැනි ක්‍රියාවන් සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන කාර්යාල පවත්වාගෙන යන විදේශීය ගැණුම්කරුවන්ට රෙදිපිළි, සම් ආශ්‍රිත නිෂ්පාදන, පාවහන් සහ මළු නිෂ්පාදනය කරන ආයතන කරනු ලබන සැපයුම් මගින් උපයන විදේශ විනිමය සංස්ථාපිත බදුවලින් නිදහස් කරන ලදී.
  - සී/ස ශ්‍රී ලංකන් ගුවන්සේවා සමාගම සහ සී/ස මිහින් ලංකා (පෞද්ගලික) ගුවන් සමාගම සියළුම ප්‍රභවයන්ගෙන් ලබන ආදායම් සම්බන්ධයෙන් වසර 10 ක් දක්වා ආදායම් බද්දෙන් නිදහස් කරන ලද අතර, මෙම ආයතනයන් වාර්ෂිකව ලබන දළ ලාභයෙන් සියයට 25 ක් වන ලාභාංශයක් රජයට ගෙවිය යුතුවේ.
  - ලංකා විදුලි බල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යන ආයතනයන් සියලුම ප්‍රභවයන්ගෙන් ලබන ආදායම් වසර 5 ක් දක්වා ආදායම් බද්දෙන් නිදහස් කරන අතර, මෙම ආයතනයන් ලබන වාර්ෂික දළ ලාභයෙන් සියයට 25 ක් වන ලාභාංශයක් රජයට ගෙවිය යුතු වේ.
- පුද්ගලයන් සඳහා පොලී ආදායම මත අයකරනු ලබන රඳවාගැනීමේ බද්ද සම්බන්ධයෙන් පහත සඳහන් වෙනස්කම් සිදු කරන ලදී.
  - තක්සේරු කරන වර්ෂයේ තක්සේරු ආදායම රුපියල් 500,000 ඉක්මවා නොයයි නම්, එවිට බදු අඩු කිරීමක් සිදු නොකෙරේ.
  - තක්සේරු කරන වර්ෂයේ තක්සේරු ආදායම රුපියල් 500,000 ට වැඩි නමුත් රුපියල් 1,500,000 නොඉක්මවන්නේ නම් තක්සේරු කරන වර්ෂය සඳහා පොලී ආදායමෙන් සියයට 2.5 ක් බදු අඩු කරගනු ලැබේ.
  - තක්සේරු කරන වර්ෂයේ තක්සේරු ආදායම රුපියල් 1,500,000 ට වැඩි නම් තක්සේරු කරන ලද වර්ෂය සඳහා පොලී ආදායමෙන් සියයට 8 ක් බදු අඩු කරගනු ලැබේ.
- පුණ්‍ය ආයතන සඳහා පොලී ආදායම මත අය කරනු ලබන රඳවාගැනීමේ බද්ද සම්බන්ධයෙන් පහත සඳහන් වෙනස්කම් සිදුකරන ලදී.
  - තක්සේරු කරන ලද වර්ෂයේ තක්සේරු ආදායම රුපියල් 500,000 ඉක්මවා නොයයි නම්, එවිට බදු අඩු කිරීමක් සිදු නොකෙරේ.
  - තක්සේරු කරන ලද වර්ෂයේ තක්සේරු ආදායම රුපියල් 500,000 ට වැඩි නම් තක්සේරු කරන ලද වර්ෂය සඳහා පොලී ආදායමෙන් සියයට 8 ක් බදු අඩු කරගනු ලැබේ.
- සාංගමික ණය සුරැකුම්පත් මත රඳවා ගැනීමේ බද්ද රජයේ සුරැකුම්පත් මත රඳවා ගැනීමේ බද්ද හා සම මට්ටමේ සැලකීමට පියවරගන්නා ලදී.

| | | |
|---|---|---|
| | - | නිශ්චිත ගාස්තු මත රඳවා ගැනීමේ බද්ද ඉවත් කරන ලදී. |
| | - | ආර්ථික සේවා ගාස්තු පනතේ නිර්වචනය කර ඇති බෙදාහරින්නන්, ලොතරැයි නියෝජිතයන්, ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල් සහ සියලුම ගුවන් සමාගම් හා නැව් සමාගම්වල පිරිවැටුම ආර්ථික සේවා ගාස්තුවෙන් නිදහස් කරන ලදී. |
| | - | ආර්ථික සේවා ගාස්තුවට යටත් වන පිරිවැටුම් සීමාව කාර්තුවට රුපියල් මිලියන 7.5 සිට රුපියල් මිලියන 25 දක්වා වැඩි කරන ලදී. |
| | - | කාර්තුමය පදනම මත ආර්ථික සේවා ගාස්තු බදු ගෙවිය යුතු අතර, දැනට පවතින කාර්තුමය පදනම මත ආර්ථික සේවා ගාස්තු සඳහා වාර්තා ඉදිරිපත් කිරීම වෙනුවට වාර්ෂික පදනම මත වාර්තා ඉදිරිපත් කිරීමට අවසර දෙන ලදී. |
| | - | කාණ්ඩ පහක ආර්ථික සේවා ගාස්තු ව්‍යුහය (සියයට 0.05, 0.1, 0.25, 0.5 සහ 1) කාණ්ඩ හතරක ව්‍යුහයක් (සියයට 0.1, 0.25, 0.5 සහ 1) ලෙස සරල කරන ලදී. |
| | - | හර බද්ද (Debits Tax) ඉවත් කරන ලදී. |
| | - | සමාජ වගකීම් බද්ද ඉවත් කරන ලදී. |
| | - | රටේ ආර්ථික සංවර්ධන අවශ්‍යතාව සලකා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් කලින් කලට ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියෝගයක් මගින් නිශ්චිත වශයෙන් දක්වනු ලබන ක්‍රියාකාරකම් සඳහා එ.ජ.ඩොලර් මිලියන 3 කට නොඅඩු ආයෝජනයක් හෝ ඊට සමාන රුපියල් වලින් ආයෝජනයක් සිදුකරන සමාගමකට එම නව ක්‍රියාකාරකම් සඳහා දේශීය ආදායම් පනත යටතේ වසර 7 ක බදු විරාමයක් ලබා දෙන ලදී. |
| | - | රුපියල් මිලියන 50 ට නො අඩු ආයෝජනයන් සිදුකරන ව්‍යවසායයන්ගේ ලාභ සහ ආදායම් වසර 3 ක් දක්වා ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | දේශීයව ලබාගන්නා ලද වී වලින් කෙරෙන සහල් නිෂ්පාදන විකුණුම් පිරිවැටුම මත වූ සියයට 1.5 ක ජාතිය ගොඩනැගීමේ සහනදායී බදු අනුපාතය සියයට 2 ක් දක්වා ඉහළ දමන ලදී. |
| | - | රෙදිපිළි පංගු මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය හරහා ක්‍රියාත්මක කළ එකතු කළ අගය සඳහා පැවති බදු විලම්බන ක්‍රමය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ පරිපාලනය යටතට ගෙන ඒමට කටයුතු කරන ලද අතර, පෙර ක්‍රමය යටතේ ආවරණය නොවූ පහත සඳහන් සැපයුම්කරුවන්ටද මෙම පහසුකම ලබා දෙන ලදී.<br>- අපනයනකරුවන්ට භාණ්ඩ සපයන සැපයුම්කරුවන්<br>- අපනයනකරුවන්ට එකතු කළ අගය සහිත සේවාවන් සපයනු ලබන සැපයුම්කරුවන්<br>- විශේෂිත ව්‍යාපෘති සඳහා සැපයීම් කරන සැපයුම්කරුවන්<br>- එකතු කළ අගය මත බදු පනතේ 22 (7) වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි වී සිටින තැනැත්තන්ට අදාල සැපයීම් කරන සැපයුම්කරුවන් |
| 2011 අප්‍රේල් 24 | - | හයිබ්‍රිඩ් වාහන, ත්‍රී රෝද රථ සහ එන්ජින් ධාරිතාවය 1,600 cc ට වඩා අඩු පෙට්‍රල් මෝටර් රථ ආනයනය මත වූ නිෂ්පාදන බද්ද වැඩිකරන ලදී. |
| 2011 ඔක්තෝබර් 20 | - | දුම්වැටි මත පනවා තිබූ නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී. |
| 2011 ඔක්තෝබර් 25 | - | මධ්‍යසාර (මෝල්ට් මධ්‍යසාර හැර) සහ මෝල්ට් මධ්‍යසාර සඳහා සුරා බදු පිළිවෙලින් සම්මත මධ්‍යසාර ලීටරයකට රුපියල් 60 කින් සහ තොග ලීටරයකට රුපියල් 5 කින් වැඩි කරන ලදී. |
| 2011 නොවැම්බර් 22 | - | දේශීය ශාක සාරයෙන් හෝ ඒවායේ ඵලයන් භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන මත්පැන් වර්ග සඳහා වන සුරා බද්ද සම්මත ලීටරයකට රුපියල් 100 දක්වා අඩු කරන ලදී. |

| | | |
|---|---|---|
| | - | සුඛෝපභෝගී වාහන (2500 cc ට වැඩි ඩීසල් කාර් සහ 2000 cc ට වැඩි පෙට්‍රල් කාර්), අර්ධ සුඛෝපභෝගී වාහන (2201 සිට 2500 cc දක්වා ඩීසල් කාර්, 2201 cc ට වැඩි ඩීසල් ජීප් රථ, 1801 cc සිට 2000 cc දක්වා පෙට්‍රල් කාර් සහ 1801 cc ට වැඩි පෙට්‍රල් ජීප් රථ) සහ ද්විත්ව කාර්යය වාහන (2200 cc ට වැඩි ඩීසල් කැබ් රථ සහ 1800 cc ට වැඩි පෙට්‍රල් කැබ් රථ) සඳහා මෝටර් වාහන බද්ද වැඩි කරන ලදී. |
| 2011 නොවැම්බර් 24 | - | මෝටර් වාහන අලුතින් ලියාපදිංචි කිරීමේ ගාස්තු සඳහා අදාළ රඳවා ගැනීමේ බද්ද වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු සමග ඒකාබද්ධ කරන ලද අතර යතුරු පැදි, ත්‍රී රෝද රථ, මෝටර් ට්‍රයිසිකල් වෑන්, මෝටර් රථ, ප්‍රයිම් මූවර්, ෆෝර්ක් ලිෆ්ට් සහ ද්විත්ව කාර්යය සහිත වාහන ලියාපදිංචි කිරීමේ දී බලපැවැත්වෙන ලියාපදිංචි කිරීමේ ගාස්තුව වැඩි කරන ලදී. |
| | - | වාර්ෂිකව ආදායම් බලපත්‍ර ගාස්තු යතුරු පැදි සහ ත්‍රී රෝද රථ සඳහා රුපියල් 150 කින් සහ අනෙකුත් වාහන කාණ්ඩ සඳහා රුපියල් 500 කින් වැඩි කරන ලදී. |
| 2012 ජනවාරි 01 | - | පහත දැක්වෙන අයිතමයන් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.<br>- ජල විදුලි බල උත්පාදනය සඳහා යොදා ගනු ලබන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, සංචාරක හෝටල් සහ ගුවන් සේවා සඳහා අවශ්‍ය වන දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදිත භාණ්ඩ, ටින් මාළු, ටර්බයින, හඳුනාගත් රාජ්‍ය ආයතනයන්ට අවශ්‍ය ආනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවට ආදේශනය කරනු ලබන දේශීයව නිෂ්පාදිත භාණ්ඩ සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන<br>- පර්යේෂණ හා සංවර්ධන සේවා, වාණිජ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන් සහ චිත්‍ර ශිල්පීන් විසින් ඔවුන්ගේ චිත්‍ර නිර්මාණ සැපයීම<br>- ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල් සඳහා පොලී, ලාභාංශ හෝ ණය උපකරණ මගින් ලැබෙන ලැබීම්. |
| | - | අපනයනකරුවන් සඳහා භාණ්ඩ තොග සහ සිල්ලරට විකිණීම, නැවුම් කිරි, අමු තේ දළු, කුරුඳු, රබර් (ලේටෙක්ස්, ක්‍රේප් හෝ ෂීට් රබර්), පිරවුම්හලක විකුණන පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්, දේශීයව නිෂ්පාදනය කළ මැටි, උළු කැට සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන එම නිෂ්පාදකයා විසින් විකිණීම, චිත්‍ර නිර්මාණකරුවෙකු විසින් තම චිත්‍ර විකිණීම ආදිය ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | ලබාගන්නා ජාත්‍යන්තර ඇමතුම් සඳහා ජාත්‍යන්තර ක්‍රියාකරු විදුලි සංදේශ බද්ද මිනිත්තුවකට රුපියල් 2 සිට රුපියල් 3 දක්වා ඉහළ දමන ලදී. |
| | - | ලැබෙන ජාත්‍යන්තර ඇමතුම් සඳහා ජාත්‍යන්තර ක්‍රියාකරු විදුලි සංදේශ බද්ද මිනිත්තුවකට එ.ජ. ඩොලර් 0.07 සිට එ.ජ. ඩොලර් 0.09 දක්වා ඉහළ දැමීම. |
| 2012 මාර්තු 31 | - | මෝටර් රථ, ත්‍රී රෝද රථ සහ යතුරු පැදි ආනයනය සඳහා නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී. |
| | - | මධ්‍යසාර (මෝල්ට් මධ්‍යසාර හැර) සහ මෝල්ට් මධ්‍යසාර සඳහා සුරා බදු පිළිවෙලින් සම්මත මධ්‍යසාර ලීටරයකට රුපියල් 60 කින් සහ තොග ලීටරයකට රුපියල් 5 කින් වැඩි කරන ලදී. |
| | - | දුම්වැටි මත පනවා තිබූ නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී. |
| **අපේක්ෂිත** | | |
| 2012 අප්‍රේල් 01 | - | ව්‍යාපාරයේ පරිමාණය සහ ආයෝජන ප්‍රමාණය අනුව කෘෂිකර්මය හා කෘෂි සැකසීම්, සත්ව පාලනය හා සකස් කිරීම්, මාළු ඇල්ලීම හා මාළු සකස් කිරීම්, තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර හෝ දැනුම් ක්‍රියාදාමයන් බාහිරින් ලබා ගැනීම, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, රූපලාවන්‍ය කටයුතු, ශීත කාමර සහ ගබඩා, සංචාරක කර්මාන්තය, කලා කටයුතු ඇතුළු නිර්මාණශීලී කටයුතු, ක්‍රීඩා සහ ශරීර සුවතා මධ්‍යස්ථාන යන ඕනෑම ක්‍රියාකාරකමක නිරත වන නව ව්‍යවසායයන් සඳහා ද නිපැයුම් නිෂ්පාදන සඳහා දැනට ලබා දී තිබෙන ආදායම් බදු නිදහස් කිරීම දීර්ඝ කිරීම. |

- පවතින ව්‍යාපාරයක් පුළුල් කිරීම සඳහා අවම වශයෙන් රුපියල් මිලියන 50 ක්, 2015 මාර්තු 31 දිනට පෙර ආයෝජනය කරන්නේ නම් එම ආයෝජනය කළ මුදල එසේ ආයෝජනය කළ වර්ෂයේ සිට ආරම්භ වන වර්ෂ 4 ක කාලපරිච්ඡේදය තුළ එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආයෝජන මුදලින් සියයට 25ක උපරිමයකට යටත්ව තක්සේරු වන ආදායමෙන් අඩු කිරීමට සුදුසුකම් ලබන ගෙවීමක් ලෙසට සැලකීම.
- සිමෙන්ති, යකඩ, ඖෂධ, රෙදිපිළි සහ කිරිපිටි යන නිෂ්පාදනයන් සඳහා සිදුකරනු ලබන ආයෝජනය සඳහා  නව ව්‍යාපාරයක් සඳහා වසර 5 ක බදු විරාමයක් හා ඉක්බිතිව සහනදායී ආදායම් බදු අනුපාතයක් සහ පවත්නා ව්‍යාපාරයක් සඳහා වසර 5 ක සහනදායී ආදායම් බදු අනුපාතයක් සහ සුදුසුකම් ලබන ගෙවීම් සහනයන් ලබාදීම.
- ව්‍යාපාරයක් විසින් පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ ආනයනය මත එකතු කළ අගය මත බද්ද, තීරු බද්ද, සෙස් බද්ද සහ වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද, ව්‍යාපෘතිය ආරම්භ කෙරෙන කාලපරිච්ඡේදය තුළ අය නොකිරීම.
- බදු නිදහස හිමි ආයෝජකයන්ට අදාළ වන බදු නීතීන් ඇතුලත් විධිවිධානයන් සමසේ ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා වැඩිදියුණු කළ පාලක යාන්ත්‍රණයක් හඳුන්වා දීම.
- ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහ ළමා ආරක්ෂණ අධිකාරියේ ලාභ සහ ආදායම් (ලාභාංශ හා පොලී ආදායම් නොවන), ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත රටකින් ලැබෙන රාජ්‍ය භාග බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නේ නම් එකී රාජ්‍ය භාග, ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදලක ඒකක නිදහස් කරගැනීමෙන් උද්ගතවන ලාභ සහ ආදායම්, ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට ණයදීමෙන් ශ්‍රී ලංකාවෙන් පිටත යම් පුද්ගලයෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට උපචිතවන පොලී, ක්‍රීඩාංගන, ක්‍රීඩාගාර හෝ ක්‍රීඩා සංකීර්ණ පරිපාලනයෙන් උද්ගත වන ලාභ හා ආදායම් සහ ශ්‍රී ලංකාවට ගෙන්වන ලද  ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන ක්‍රීඩා පුහුණුකරුවෙකු එම සේවය සඳහා ලබන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
- සංවර්ධන බැංකු කටයුතු සඳහා අලුතින් පිහිට වූ වාණිජ බැංකු ශාඛාවක ලාභ සහ ආදායම් සියයට 24 ක් වන ආදායම් බදු අනුපාතයකට යටත් කිරීම.
- පර්යේෂණ හා වැඩිදියුණු කිරීමේ කටයුත්තක නිරත වීමෙන් ලබන ලාභ සහ ආදායම් මත බදු අනුප්‍රමාණය, සමාගමක් නොවන පුද්ගලයෙකු සම්බන්ධයෙන් සියයට 16 ක උපරිමයකටත් සමාගමක් සම්බන්ධයෙන් සියයට 20 කටත් අඩු කිරීම.
- ශ්‍රී ලාංකික වෙළෙඳ නාමයකින් අගය වැඩි කිරීමක් සහිතව පිරිසිදු ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) අපනයනය කිරීම සඳහා අපනයනකරුවෙකු සමග බද්ධ ව්‍යාපාරයක් ස්ථාපනය කර ඇති, වගාකරුවෙකු ද වන තේ නිෂ්පාදකයෙකු හෝ තේ නිෂ්පාදකයෙකු එකී බද්ධ ව්‍යාපාරය සඳහා මිලදීගත් තේ ප්‍රමාණයට ආරෝපණය කළ හැකි නිෂ්පාදන ආදායම් ප්‍රමාණය මත වන ආදායම් බදු සියයට 12 ක සහනදායී බදු අනුප්‍රමාණයකට හිමිකම් ලැබීම.
- දේශීය අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදනයේ නිරත පුද්ගලයෙකුගේ හෝ හවුල් ව්‍යාපාරයක ලාභ සහ ආදායම් මත වන උපරිම බදු අනුප්‍රමාණය සියයට 12 කට  අඩු කිරීම.
- සෞඛ්‍ය සේවාවලින්  ලබන ලාභ සහ ආදායම් සඳහා උපරිම බදු අනුප්‍රමාණය සියයට 12 කට අඩු කිරීම.
- තාක්ෂණයෙන් ඉහළ ඕනෑම පිරියත, යන්ත්‍ර හෝ උපකරණ අත්පත්කර ගැනීමේ පිරිවැය, සේවා නියුක්තිකයෙකු විසින් පාවිච්චි කරනු ලබන මෝටර් වාහනයක් සම්බන්ධයෙන් සේවායෝජකයෙකු විසින් දරන වියදම, මෝස්තර සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධනය සහ නව නිෂ්පාදන සොයා ගැනීම යන සේවා සැපයීම සම්බන්ධයෙන් දරන ප්‍රවාහන වියදම සහ යම් තැනැත්තෙකු විසින් ක්‍රීඩාංගන, ක්‍රීඩා මණ්ඩප හෝ ක්‍රීඩා සංකීර්ණ නඩත්තුව සඳහා දරන වියදම් ලාභ සහ ආදායම් නිශ්චය කිරීමේ දී අඩු කිරීම.
- මැසීමට භාවිතා කරන නූල් සහ එළවළු කෙඳි ආශ්‍රිත නූල් හැර අනෙකුත් සියලු නූල් සියලු බදුවලින් නිදහස් කිරීම.

| | | |
|---|---|---|
| | - | ලාභ මත ආදායම් බද්දට යටත් වන ඕනෑම ව්‍යාපාරයක පිරිවැටුම ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් කිරීම මගින් ආර්ථික සේවා ගාස්තු ගෙවීමේ බැදියාව තවදුරටත් ලිහිල් කිරීම. |
| | - | දේශීයව නිෂ්පාදනය කළ මැටි උළු කැට සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදකයා විසින්ම විකිණීම ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් කිරීම. |
| | - | ආර්ථික සේවා ගාස්තු සඳහා බදු බැදියාවෙන් නිදහස් සීමාව කාර්තුවකට රුපියල් මිලියන 25 සිට රුපියල් මිලියන 50 දක්වා වැඩි කිරීම. |
| **රාජ්‍ය වියදම** | | |
| 2011 ජනවාරි 01 | - | සෑම රජයේ සේවකයෙකුටම ඔවුන්ගේ මූලික වැටුපෙන් සියයට 5 කට සමානවන විශේෂ දීමනාවක් ලබාදෙන ලදී. |
| | - | රජයේ සේවයේ සිටින මාණ්ඩලික නොවන ශ්‍රේණිය සඳහා වන ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 5,850 දක්වා රුපියල් 600 කින් වැඩිකරන ලදී. |
| | - | විශ්‍රාමිකයින් සඳහා වන ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 2,675 දක්වා රුපියල් 300 කින් වැඩි කරන ලදී. |
| | - | විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවන "අධ්‍යයන දීමනාව" අධිකරණ සේවා කොමිසම යටතේ සිටින අධිකරණ සාමාජිකයන්ට ගෙවන "පෞද්ගලික දීමනාව" සහ වෛද්‍යවරුන් සඳහා "ඇමතුම් විට පැමිණීම්" දීමනාව සියයට 25 කින් වැඩි කරන ලදී. |
| | - | විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ පර්යේෂණ ආයතනවල සේවය කරන මාණ්ඩලික පන්තියට අයත් පර්යේෂණවල නිරතවන නිලධාරීන්ට මූලික වැටුපෙන් සියයට 25 කට සමානවන මාසික පර්යේෂණ දීමනාවක් හඳුන්වා දෙන ලදී. |
| 2011 මැයි 07 | - | කිලෝග්‍රෑම් 50 ක අමිශ්‍ර පොහොර බෑගයක් රුපියල් 1,200 ක් බැගින්ද කිලෝග්‍රෑම් 50 ක මිශ්‍ර පොහොර බෑගයක් රුපියල් 1,300 බැගින්ද ලබා දෙන පරිදි සියළුම බෝග සඳහා පොහොර සහනාධාරය ලබාදෙන ලදී. |
| 2011 ජූලි 01 | - | රජයේ සේවයේ මාණ්ඩලික ශ්‍රේණියේ සේවා නියුක්තිකයන් සඳහා වන ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 5,850 දක්වා රුපියල් 600 කින් වැඩි කරන ලදී. |
| | - | 2004 ජනවාරි 01 දිනට පෙර සහ 2004 ජනවාරි 01 සිට 2005 දෙසැම්බර් 31 දක්වා කාලය ඇතුළත විශ්‍රාම ගිය පුද්ගලයන්ට අදාළ මාසික විශ්‍රාම වැටුප පිළිවෙලින් රුපියල් 750 කින් හා රුපියල් 250 කින් වැඩි කරන ලදී. |
| 2012 ජනවාරි 01 | - | සියළුම රාජ්‍ය සේවකයින් සඳහා මූලික වැටුපෙන් සියයට 15 ක විශේෂ දීමනාවක් ලබා දෙන ලදී. |
| | - | ග්‍රාම නිලධාරීන් සඳහා ගෙවනු ලබන ප්‍රවාහන හා කාර්යාල දීමනා ඉහළ දමන ලදී. |
| | - | 2003 දෙසැම්බර් 31 දින හෝ එයට පෙර විශ්‍රාම ලැබූ රාජ්‍ය සේවකයින් සඳහා ගෙවනු ලබන විශ්‍රාම වැටුප මසකට රුපියල් 1,000 කින් ද, 2004 ජනවාරි 01 හා 2005 දෙසැම්බර් 31 අතර කාලයේ විශ්‍රාම ලැබූවන් සඳහා ගෙවනු ලබන විශ්‍රාම වැටුප මසකට රුපියල් 500 කින් ද වැඩිකරන ලදී. |
| 2012 පෙබරවාරි 13 | - | ධීවර කර්මාන්තයේ දී යොදාගනු ලබන භූමිතෙල් යාත්‍රා සහ ඩීසල් යාත්‍රා සඳහා පිළිවෙලින් ලීටරයකට රුපියල් 25 ක සහ ලීටරයකට රුපියල් 12 ක සහනාධාරයක් ලබා දෙන ලදී. |
| 2012 පෙබරවාරි 15 | - | විදුලිය නොමැති සියළුම කුටුම්භයන් සඳහා මාසිකව රුපියල් 200 ක භූමිතෙල් සහනාධාරයක් ලබා දෙන ලදී. |
| **රාජ්‍ය ණය කළමනාකරණය** | | |
| 2011 ජූලි 27 | - | එ.ජ.ඩොලර් බිලියන 1 ක් වූ හතරවන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2011 අගෝස්තු 30 | - | නැවත කැඳවිය හැකි රුපියල් මිලියන 18,832 ක රුපියල් ණය ප්‍රමාණයක් ආපසු ගෙවීමට කටයුතු කරන ලදී. |

## මුදල් අංශය

| | | |
|---|---|---|
| 2011 ජනවාරි 11 | - | ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය සියයට 7.00 දක්වා පදනම් අංක 25 කින් අඩු කළ අතර, ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 8.50 දක්වා පදනම් අංක 50 කින් අඩුකරන ලදී. |
| 2011 අප්‍රේල් 29 | - | වාණිජ බැංකු වෙතැති රුපියල් තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය සියයට 8 දක්වා සියයට 1 කින් වැඩි කරන ලදී. |
| 2012 පෙබරවාරි 03 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙලින් සියයට 7.50 සහ සියයට 9.00 දක්වා පදනම් අංක 50 කින් වැඩිකරන ලදී. |
| 2012 මාර්තු 15 | - | මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන දිනවලදී එක් සහභාගිත්ව ආයතනයකට නිත්‍ය පහසුකම යටතේ ලබාගත හැකි දෛනික ප්‍රතිමිලදී ගැණුම් ප්‍රමාණය රුපියල් මිලියන 100 ක උපරිමයකට සීමාකරන ලදී. |

## මූල්‍ය අංශය

**ලියාපදිංචි බැංකු**

| | | |
|---|---|---|
| 2011 ජනවාරි 11 | - | කොටස් වෙළෙඳපොළේ ගනුදෙනුවන කොටස් මත බැංකු සපයන ආන්තික පහසුකම් නිසා වත්කම්වල ව්‍යාජ මිල වැඩිවීම් සහ කොටස් මිලෙහි ඇතිවන උච්චාවචනයන් මගින් ඇතිවිය හැකි අවදානම් පාලනය කිරීම සඳහා වඩා සුදුසු අවදානම් කළමනාකරණ ප්‍රමිතීන් වලට අනුගත වීමටත් සහ ඒ සඳහා සීමාවන් හඳුන්වාදීමටත් සියලුම බලපත්‍රලාභී බැංකු වෙත නියම කරන ලදී. |
| 2011 ජනවාරි 24 | - | ප්‍රථම වරට ඉස්ලාමීය මූලධර්ම අනුව ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු කටයුතු කිරීම සඳහා සීමාසහිත අමානා බැංකුව වෙත වාණිජ බැංකු බලපත්‍රයක් නිකුත් කරන ලදී. |
| 2011 පෙබරවාරි 18 | - | පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහන යටතේ උප ව්‍යාපෘති සඳහා පුද්ගලයන්ට දෙනු ලබන ණය මුදල් රුපියල් 80,000 සිට රුපියල් මිලියනය දක්වා වැඩිකරන ලදී. |
| 2011 මාර්තු 09 | - | ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති නියාමනය සහ අධීක්ෂණය කිරීමේ අරමුණින් ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් ක්‍රම සඳහා පහත සඳහන් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.<br>- 2011 අංක 1 දරන ජංගම දුරකථන ආශ්‍රිත ක්‍රම සඳහා වූ ගෙවීම් මාර්ගෝපදේශ - බැංකු මූලික ගෙවීම සඳහා<br>- 2011 අංක 2 දරන ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් ක්‍රම සඳහා වූ මාර්ගෝපදේශ - භාරකාර ගිණුම් පදනම් කරගත් ගෙවීම් සේවා සඳහා |
| 2011 මාර්තු 28 | - | බලපත්‍රලාභී බැංකු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් වෙත 2011 අංක 01 දරණ ගැසට් පත්‍රයේ සඳහන් ගනුදෙනුකරු හඳුනාගැනීම සහ ගනුදෙනුකරු පිළිබඳව සුපරීක්ෂාකාරී වීම ඇතුළුව අනෙකුත් නීති හා මෙහෙයුම් නිර්ණායකයන් නිකුත් කරන ලදී. |
| 2011 අප්‍රේල් 01 | - | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ දෙනු ලබන උප ණයවල උපරිම සීමාව වැඩි කරන ලදී. |
| | - | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය සඳහා වන පොලී අනුපාතය වර්ෂයකට සියයට 5 සිට වර්ෂයකට සියයට 4 දක්වා අඩු කරන ලද අතර, ඊට සමගාමීව උප ණය සඳහා වන පොලී අනුපාතය වර්ෂයකට සියයට 10 සිට වර්ෂයකට සියයට 9 දක්වා අඩු කරන ලදී. |
| 2011 අප්‍රේල් 28 | - | කොටස් වෙළෙඳපොළ ගනුදෙනු සඳහා බැංකු විසින් සපයන ලද සමස්ත පහසුකම් සහ ප්‍රථම මහජන නිකුතු සඳහා ඇපකර පිණිස බැංකු මගින් ලබාදෙන පහසුකම් සඳහා සීමා හඳුන්වා දෙන ලදී. |

2011 අප්‍රේල් 29 - 2011 අයවැය යෝජනාවලට අනුව යමින් බදු අනුපාතයන් අඩු කිරීම නිසා වන ඉතිරිකිරීම් භාවිතා කරමින් ආයෝජන අරමුදල් ගිණුම් (IFA) පිහිටුවීම සහ මෙහෙයවීම සඳහා මාර්ගෝපදේශයන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී.

2011 ජූනි 06 - තැන්පතු හා ණය සඳහා පොලී අනුපාත, විදේශ විනිමය අනුපාත, ගාස්තු සහ කොමිස් මුදල් හා වෙනත් සේවා සඳහා අයකිරීම් පිළිබඳ විස්තර බැංකු ශාඛා සහ ඒකක වල ප්‍රදර්ශනය කිරීම පුළුල් කිරීමටත්, එම තොරතුරු අදාළ බැංකුවල වෙබ් අඩවිවල පළකිරීමටත් බලපත්‍රලාභී බැංකුවලට නියම කරන ලදී.

2011 ජූලි 22 - බාසල් II සම්මුතියේ පළමු මූලධර්මය යටතේ වන මෙහෙයුම් අවදානමට අදාළ වඩා දියුණු ප්‍රවේශයකට සූදානම් වීම සඳහා මෙහෙයුම් අවදානම හා සම්බන්ධ අවදානම් කළමනාකරණයන්ට සහ යහපාලන භාවිතයන්ට සුදුසු ප්‍රාග්ධනයක් පවත්වාගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ කෙටුම්පතක් නිකුත් කරන ලදී.

2011 අගෝස්තු 09 - බලපත්‍රලාභී බැංකු වෙත 2011 අංක 01 දරන අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1699/10 හි සඳහන් ගනුදෙනුකරු හඳුනාගැනීම සහ ගනුදෙනුකරු පිළිබඳව සුපරීක්ෂාකාරීවීම සම්බන්ධයෙන් සංශෝධනයක් නිකුත් කරන ලදී.

2011 අගෝස්තු 15 - උතුරු සහ නැගෙනහිර පළාත්වල අභ්‍යන්තර ගැටුම් පැවති කාලයේ විනාශ වූ නිවාස නැවත අළුත්වැඩියා කිරීම සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ දායකත්වයෙන් නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

2011 සැප්තැම්බර් 29 - පහත පරිදි 2012 සිට 2014 දක්වා සියළුම බැංකු සඳහා බලපත්‍ර ගාස්තු වැඩි කරන ලදී.

| පෙර වසර අවසානය වන විට ඇති මුළු වත්කම් ප්‍රමාණය | බලපත්‍ර ගාස්තු |
|---|---|
| රුපියල් බිලියන 200 ට වැඩි | රුපියල් මිලියන 20 |
| රුපියල් බිලියන 125 සිට රුපියල් බිලියන 200 | රුපියල් මිලියන 15 |
| රුපියල් බිලියන 75 සිට රුපියල් බිලියන 125 | රුපියල් මිලියන 10 |
| රුපියල් බිලියන 25 සිට රුපියල් බිලියන 75 | රුපියල් මිලියන 05 |
| රුපියල් බිලියන 25 ට අඩු | රුපියල් මිලියන 02 |

2011 ඔක්තෝබර් 03 - ඉන්දියාවේ සීමාසහිත “ඇක්සිස්” බැංකුවට ශ්‍රී ලංකාවේ ශාඛාවක් විවෘත කිරීම සඳහා වාණිජ බැංකු බලපත්‍රයක් නිකුත් කරන ලදී.

2011 ඔක්තෝබර් 05 - ගනුදෙනුකරුවන් සඳහා ආචාරධර්ම පද්ධතියකට බැංකු අනුගත විය යුතු බව අවධාරණය කරමින් බලපත්‍රලාභී බැංකු සඳහා ගනුදෙනුකරුවන්ගේ ප්‍රඥප්තියක් නමින් විධානයක් නිකුත් කරන ලද අතර එය නිකුත් කළ දින සිට මාස 06 ක කාලයක් තුළ බැංකු විසින් ක්‍රියාවට නැංවිය යුතු වේ.

- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතියක් සඳහා විධානයක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද අතර, නිකුත් කළ දින සිට මාස 06 ක කාලයක් තුළ බැංකු විසින් ක්‍රියාවට නැංවිය යුතුවේ.

2011 ඔක්තෝබර් 27 - බලපත්‍රලාභී වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකක සහ අක්වෙරළ බැංකු ඒකකවල විනිමය ගණුදෙනු සඳහා පිළිගත් විදේශ මුදල් ඒකකයක් ලෙස චීන රෙන්මින්බි හඳුන්වා දෙන ලදී.

2011 ඔක්තෝබර් 31 - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවයේ නිර්ණායක පුළුල් කරන ලදී.

- බදු ඉතුරුම් භාවිතා කොට ආයෝජන අරමුදල් ගිණුම (IFA) යටතේ ණය පහසුකම් ලබාදිය හැකි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සුදුසුකම් ලැබීමේ පටිපාටියද ඇතුළත්ව ණය ලබාදෙන ක්ෂේත්‍රයන් තවදුරටත් පුළුල්කරන ලදී.

2011 නොවැම්බර් 08 - අනේවාසිකයකු සතු විදේශ බැංකු ඒකකයක පවත්නා වූ ඕනෑම ගිණුමකට මුදල් බැර කිරීම මගින් රට තුළට මුදල් ගෙන්වා ගැනීමටත්, විනිමය පාලකගේ සාමාන්‍ය හෝ විශේෂිත අනුමැතියකට යටත්ව දේශීය බැංකු ඒකක සතුව පවත්නා සියළුම ජංගම ගිණුම් මගින් පිළිගත් විදේශ මුදල් ඒකකවලින් අරමුදල් හුවමාරුවටත් අනුමැතිය ලබාදෙන ලදී.

| | | |
|---|---|---|
| 2011 නොවැම්බර් 23 | - | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 32, 39 සහ SLFRS 7 යටතේ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට කරන ව්‍යවස්ථාපිත වාර්තාකරණයට අදාළ කෙටුම්පත් මාර්ගෝපදේශයන් නිකුත් කරන ලදී. |
| 2011 දෙසැම්බර් 16 | - | කොටස් වෙළෙඳපොළෙහි ආන්තික ණය පහසුකම් සඳහා වූ සීමාව ඉවත් කොට, අධ්‍යක්ෂක මණ්ඩලයට සිය බැංකුවට සුදුසු අභ්‍යන්තර සීමාවන් පවත්වාගෙන යැමට ඉඩ ලබා දෙන ලදී. |
| 2012 ජනවාරි 02 | - | පිබිදෙන උතුර චක්‍රීය අරමුදල - II වන අදියර ණය යෝජනා ක්‍රමය සහ නැගෙනහිර පළාතේ ආර්ථික කටයුතු යළි නගා සිටුවීම සඳහා වන චක්‍රීය අරමුදල - II වන අදියර ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. |
| 2012 මාර්තු 02 | - | එ.ජ. ඩොලර් මිලියන 1 ක අවම සීමාවකට යටත්ව, විදේශ විනිමයන්හි දෛනික කාරක ශේෂයට අදාළව වාණිජ බැංකුවල ශුද්ධ විවෘත තත්ත්වය සඳහා වූ විදේශ විනිමය සීමා ඒ වන විට පැවති සීමාවෙන් තුනෙන් එකක් දක්වා අඩු කරන ලදී. |
| 2012 මාර්තු 12 | - | ලියාපදිංචි බැංකුවල රුපියල්වලින් නාමනය කරන ලද ණයෙහි වර්ධනය 2012 වසරේදී සියයට 18 ක් හෝ රුපියල් මිලියන 800 ක් යන අගයන්වලින් ඉහළ අගයට සීමාකිරීමට නියම කරන අතර, එම සීමාව ඉක්මවා ණය ලබාදීමට අවශ්‍ය කරන අරමුදල් විදේශයන්ගෙන් සපයා ගන්නා බැංකු සඳහා සියයට 23 ක් හෝ රුපියල් බිලියන 1 ක් යන අගයන්වලින් ඉහළ අගය දක්වා ඉඩ හරින ලදී. |
| **අපේක්ෂිත** | | |
| | - | 1988 අංක 30 දරණ බැංකු පනත සංශෝධනය කිරීමෙහිලා අවශ්‍ය නීතිමාලාවන් නිකුත් කිරීම. |
| | - | ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ප්‍රමිතීන්ට අදාළ බාසල් II සම්මුතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම. |
| | - | බාසල් III ක්‍රියාවට නැංවීම සඳහා සුදුසු ප්‍රතිසංස්කරණයන් හඳුන්වාදීම. |
| **අනෙකුත් මූල්‍ය ආයතන** | | |
| 2011 මාර්තු 30 | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙනස් කිරීම, ව්‍යාපාර විකිණීම, අතිරේක සමාගම් ස්ථාපනය කිරීම, ප්‍රාග්ධන නිකුතුව වෙනස්වීම් සහ සංස්ථාපිත වෙනස්කම් වැනි ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකිරීම සම්බන්ධයෙන් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අවසරය ලබා ගතයුතු බවට විධානයක් නිකුත් කරන ලදී. |
| | - | මූල්‍ය පද්ධති ස්ථායීතාව ඇති කිරීම සහ අවදානම අවම කිරීම ඵලදායීව සිදුකිරීම සඳහා සියලුම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, මුළු අවදානම මත බර තැබූ වත්කම් ප්‍රමාණයට ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සියයට 10 කට නොඅඩුව සහ මුළු අවදානම මත බර තැබූ වත්කම් ප්‍රමාණයට මූලික ප්‍රාග්ධන අනුපාතය සියයට 5 කට නොඅඩු ලෙස ජූලි මස 01 වන දින සිට පවත්වාගෙන යාම අවශ්‍ය වේ. |
| 2011 මැයි 12 | - | 2011 අයවැය යෝජනාවලට අනුව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ආයෝජන අරමුදල් ගිණුම් පවත්වාගෙන යා යුතු ආකාරය සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2011 මැයි 20 | - | සියළුම බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත 2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 7 වන වගන්තියේ සඳහන් පරිදි වාර්තාකරණ අවශ්‍යතාවයන් සඳහන් කරමින් චක්‍රලේඛ අංක 02/11 නිකුත් කරන ලදී. |
| 2011 ජූනි 22 | - | සියලුම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක්ම ඕනෑම දිනයක ව්‍යාපාර කටයුතු අවසාන කරන අවස්ථාවේදී අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණයක් පවත්වාගෙන යායුතු අතර, එම ප්‍රමාණය කොටස් හිමියන්ට ඇති වගකීම් හැර මුළු වගකීම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර වගකීම් අයිතමයන්ගේ ප්‍රමාණයෙන් සියයට 5 කට නොඅඩුව 2012 ජනවාරි 1 දින සිට පවත්වාගත යුතු අතර, එය 2013 ජනවාරි 1 දින සිට සියයට 10 ට අඩු නොවිය යුතුය. |
| 2011 අගෝස්තු 02 | - | සියළුම බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අපේක්ෂා කරන ඉහළ ව්‍යාපාරික ඉල්ලුම සපුරාලීම සහ කාර්යක්ෂම ලෙස අවදානම් කළමනාකරණය කිරීම තුළින් මූල්‍ය |

| | | |
|---|---|---|
| | | පද්ධති ස්ථායීතාවය ඇතිකිරීම සඳහා අවම මූලික ප්‍රාග්ධනය 2013 ජනවාරි 1 සිට රුපියල් මිලියන 300 දක්වා වැඩි කිරීමට ද, 2015 ජනවාරි 1 සිට එය රුපියල් මිලියන 400 දක්වා වැඩි කිරීමට ද නියම කරන ලදී. |
| 2011 සැප්තැම්බර් 05 | - | මුදල් මණ්ඩලය විසින් 2011 අංක 02 දරන මුදල් සමාගම් (වාර්තාකරණ අවශ්‍යතා) විධානය නිකුත් කරන ලදී. |
| | - | මුදල් මණ්ඩලය විසින් 2011 අංක 03 දරණ මුදල් සමාගම් (අධ්‍යක්ෂවරුන්ගේ හා විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යථා යෝග්‍යතාව තක්සේරු කිරීම) විධානය නිකුත් කරන ලදී. |
| 2011 සැප්තැම්බර් 13 | - | සියළුම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලින් නිකුත් කිරීමට නියමිත ණයකර කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමට උපදෙස් දෙන ලදී. |
| 2011 නොවැම්බර් 09 | - | 1988 අංක 78 දරණ මුදල් සමාගම් පනත අහෝසි කරමින් 2011 අංක 42 දරන නව මුදල් ව්‍යාපාර පනත නමින් නව පනතක් ප්‍රතිස්ථාපනය කරන ලදී. |

**අනෙකුත්**

| | | |
|---|---|---|
| 2011 ජනවාරි 01 | - | කොටස් ගනුදෙනු බද්ද සියයට 0.2 සිට සියයට 0.3 දක්වා වැඩි කරන ලදී. |
| 2011 පෙබරවාරි 04 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "සංවර්ධනය, සෞභාග්‍ය හා ශ්‍රී ලංකාවේ නැටුම් ශිල්පීන්" යන තේමාව යටතේ 11 වන ව්‍යවහාර මුදල් නෝට්ටු කාණ්ඩය ලෙස නව මුදල් නෝට්ටු කාණ්ඩයක් හඳුන්වා දෙන ලදී. එම කාණ්ඩය රුපියල් 20, රුපියල් 50, රුපියල් 100, රුපියල් 500, රුපියල් 1,000 හා රුපියල් 5,000 යන මුදල් නෝට්ටුවලින් සමන්විතය. |
| 2011 පෙබරවාරි 11 | - | 2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන පනත හඳුන්වාදෙන කරන ලදී. එහි අඩංගු මූලික කරුණු කිහිපයක් පහත දැක්වේ. |

- දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන් වෙන්ව සමාගම් දෙකක් ලෙස පවත්වා ගෙන යා යුතුය. පවතින සියළු රක්ෂණ සමාගම් වසර හතරක් තුළ නව පනතට අනුව කටයුතු කළ යුතුය.
- ලැයිස්තුගත නොකළ රක්ෂණ සමාගම් වසර පහක් තුළ ලැයිස්තුගත කරන ලෙස නියම කරන ලදී.
- ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත රක්ෂණ සමාගම්වලට සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතනවලට සාමාන්‍ය සහ විශේෂ නීති සහ නිර්ණායක නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.
- දැනට පවතින රක්ෂණ සමාගම්වල ප්‍රාග්ධන අවශ්‍යතා වැඩිකිරීම සඳහා සහ ආයතනමය නියෝජිතයින් සහ අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ පරීක්ෂණයට ලක් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට අවසර ලබාදෙන ලදී.
- රක්ෂණ සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝග්‍යතාවය හා උචිතභාවය ඇගයීමේ නිර්ණායක නිකුත් කරන ලදී.
- ජාතික රක්ෂණ භාරකාර අරමුදල ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතට ගන්නා ලදී.

| | | |
|---|---|---|
| 2011 මාර්තු 01 | - | ආන්තික සැපයුම්කරුවන් සඳහා ඇති ආන්තික ණය ප්‍රමාණයේ මුළු වටිනාකම ඔවුන්ගේ ශුද්ධ ප්‍රාග්ධනයේ අගය මෙන් හතර ගුණයක් ඉක්මවිය නොහැකි වන පරිදි සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් නිර්දේශයක් නිකුත් කරන ලදී. මෙම නිර්දේශය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි කරන ලද සහ පාලනය වන ආන්තික සැපයුම්කරුවන් සඳහා වලංගු නොවේ. |
| 2011 මාර්තු 15 | - | සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන විධානය පරිදි ආරම්භ මහජන අර්පණ කොටස් පහත පරිදි වෙන් කරන ලදී. |

| | | |
|---|---|---|
| | | - සුළු පරිමාණ තනි පුද්ගල ආයෝජකයන්ට (යම් කොටස් වර්ගයක 3,000 ක උපරිම කොටස් ඉල්ලුමක් කරන හෝ රුපියල් 100,000 ක උපරිමයකට යටත් කොටස් අගයක් ඉල්ලුම්කර ඇති) අවම සියයට 40 ක කොටස් නිකුත් කිරීම. |
| | | - සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කරන ලද වර්ධන හෝ සමතුලිත ඒකකභාර අරමුදල් සඳහා අවම වශයෙන් සියයට 10 ක් වත් වෙන් කළ යුතුය. එම ඒකකභාර අවම වශයෙන් නේවාසික ඒකක හිමිකරුවන් 500 කින් සමන්විත විය යුතු අතර, ඔවුන් සාමූහිකව අරමුදලෙන් සියයට 50 කට වත් හිමිකම් පෑ යුතුය. |
| 2011 මාර්තු 18 | - | රක්ෂණ සමාගම් සඳහා නව නුබුන්වත් ආන්තික නියමයන් නිකුත් කරන ලදී. |
| 2011 අප්‍රේල් 01 | - | කොළඹ කොටස් වෙළෙඳපොළේ ප්‍රධාන පුවරුවේ සහ දිරිසවි පුවරුවේ ලැයිස්තුගත කිරීමට අවශ්‍ය නීති සහ සුදුසුකම් නිර්ණායක පහත පරිදි සංශෝධනය කරන ලදී. |
| | | - සමාගමක ප්‍රාග්ධන අවශ්‍යතාවය ප්‍රධාන පුවරුව සඳහා රුපියල් මිලියන 100 සිට රුපියල් මිලියන 500 දක්වා සහ දිරිසවි පුවරුව සඳහා රුපියල් මිලියන 35 සිට රුපියල් මිලියන 100 දක්වා වැඩි කරන ලදී. |
| | | - ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගත සමාගම් සඳහා ශුද්ධ ධන වත්කම් අගය අවුරුදු 2 ක් සඳහා සහ බදු අයකිරීමෙන් පසු ශුද්ධ ලාභය අවුරුදු 3 සඳහා ද, දිරිසවි පුවරුවේ ලැයිස්තුගත සමාගම් සඳහා ශුද්ධ ධන වත්කම් අවුරුද්දක කාලයක් සඳහා ද තිබිය යුතු වේ. |
| | | - ප්‍රධාන පුවරුව සහ දිරිසවි පුවරුව සඳහා ඇති මුළු කොටස් ගණනින් මහජනයා සතු අවම කොටස් ප්‍රමාණය පිළිවෙලින් සියයට 25 සහ සියයට 10 දක්වා වැඩි කරන ලදී. |
| 2011 අප්‍රේල් 28 | - | 2010 අගෝස්තු 4 වන දින සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හඳුන්වා දුන් මිල පරාස නීතියෙහි (Price Band) තෝරාගත් කොටස් සඳහා පමණක් පැනවිය යුතු උපරිම වශයෙන් සියයට 10 ක මිල පරාසය, පවත්වාගෙන යා යුතු දින ගණන වෙළඳ දින 10 සිට වෙළඳ දින 5 දක්වා අඩු කරන ලදී. |
| 2011 මැයි 19 | - | 2010 නොවැම්බර් 29 වෙනි දින සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොටස් තැරැව්කරුවන් සඳහා සියයට 50 ක නොපිය වූ ණය ශේෂයන් පියවීමට ඇති කාලය පහත පරිදි තවදුරටත් දීර්ඝ කරන ලදී. |
| | | - 2011 සැප්තැම්බර් අග වන විට සියයට 25 ක ණයගැතියන් නිෂ්කාශනය කළ යුතුයි. |
| | | - 2011 දෙසැම්බර් අග වන විට ඉතිරි සියයට 25 ශේෂය ද නිෂ්කාශනය කළ යුතුයි. |
| 2011 ජුනි 24 | - | නව රක්ෂණ සමාගම් සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් මිලියන 500 දක්වා වැඩි කරන ලදී. |
| 2011 අගෝස්තු 16 | - | සමහර විචක්ෂණශීලී අවශ්‍යතාවයන්ට යටත්ව ආයෝජකයන් හට ණය ලබාදීමේ ඉඩ ප්‍රස්ථාව පුළුල් කිරීම සම්බන්ධයෙන් කොටස් තැරැව්කරුවන් මත පනවා තිබූ නීති සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලිහිල් කරන ලදී. |
| 2011 අගෝස්තු 26 | - | බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් කරන ලද ඉල්ලීම් සහ කොටස් වෙළෙඳපොළට ඇති පහළ මට්ටමේ අවදානම් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් කොටස් වටිනාකම් මත බැංකු මගින් ලබාදෙන ලද ණය සීමාවන් ඉවත් කරන ලදී. |
| 2011 සැප්තැම්බර් 23 | - | 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරණ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ පනත සංශෝධනය කරන ලදී. |
| 2012 පෙබරවාරි 02 | - | කොළඹ කොටස් වෙළෙඳපොළ ආයෝජකයන්ට ණය ලබාදීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති විදේශීය සමාගම්වලට අවසර ලබාදෙන ලදී. |
| 2012 මාර්තු 01 | - | බලයලත් වෙළෙඳුන්ට විදේශ විනිමය ඉදිරි විකිණීම හා/හෝ මිලදී ගැනීම සඳහා වූ ගිවිසුම් දින 90 ක උපරිම කාලයකට සීමා කිරීමට නියම කරන ලදී. |